**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

# ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2018/2019

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2021 අගෝස්තු)**

# BLE 308 - ශ්‍රමයේ නූතන ප්‍රවණතා

**අයදුම්කරුවන්ට උපදෙස් :**

**(01)** මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. (අ) කොටසේ සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතු අතර (ආ) කොටසේ ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(02) කාලය පැය තුනයි. (03)

(03) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියළුම පිටු අනුපිළිවෙල අනුව අංකනය කරන්න.

## (අ කොටස)

01. "COVID-19 වසංගතයේ ගෝලීය ව්‍යාප්තිය කාන්තාවන්ට වැඩි සෘනාත්මක බලපෑමක් ඇති කර තිබේ; වැඩි සෞඛ්‍ය අවදානමකට මුහුණ දීම, රැකියා අහිමිවීම, සහ ගෘහස්ථ හිංසනයන්ට මුහුණ දීම මින් ප්‍රධාන වේ."

(I) මෙම සෘනාත්මක බලපෑම ශ්‍රී ලංකා කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වයට සහ කාන්තා විදේශ සේවා නියුක්තිය කෙරෙහි කවර බලපෑමක් එල්ල කරනු ලබයිද? උදාහරණ යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

(II) මෙම සෘනාත්මක බලපෑමට මුහුණ දීම සඳහා වැඩ පරිසරයේ සිදුවිය යුතු වෙනස්කම් කවරේද? උදාහරණ යොදා ගනිමින් පැහැදිලි කරන්න

(ලකුණු 20)

(මුළු ලකුණු 20 X 2=40)

## (ආ කොටස)

02.

(I) සදාචාරාත්මක වටිනාකම් සහ ආචාර ධර්ම යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

(II) ‘‘යහපත් ආචාර ධර්ම යහපත් ව්‍යාපාරයක් බිහි කරයි’’. මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

(III) ‘‘නිතිය සදාචාරත්මක හැසිරීම් පාලනය කිරීමෙහිලා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි’’ සුදුසු රූප සටහන් සහ උදාහරණ යොදාගනිමින් පහදන්න

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

03.

(I) සෘජු බියගැන්වීම සහ වක්‍ර බියගැන්වීම යන්න කෙටියෙන් පහදන්න.

(ලකුණු 03)

(II) ආයතනික වෙනස්කම් කිරීම සඳහා ඉලක්ක වන ප්‍රධාන කණ්ඩායම් කවරේද? ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ප්‍රතිවිපාක කවරේද?

(ලකුණු 04)

(III) "තම ආයතනයේ සිදුවන දූෂණ, අකටයුතුකම් බලධාරීන්ට හෝ මහජනතාවට දැනුම්දීමට ප්‍රථම සේවකයන් විවිධ කරුණු කෙරෙහි තම අවධානය යොමු කරයි". මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

04.

(I) හැඟීම් ජනිත වීම කෙරෙහි බලපාන ප්‍රධාන මුලාශ්‍ර කවරේද?

(ලකුණු 03)

(II) චිත්තවේගීය ශ්‍රමය ඉටුකිරීමේ ප්‍රධාන ආකාර දෙක ලෙස මතුපිට ක්‍රියාකාරීත්වය සහ ගැඹුරු ක්‍රියාකාරීත්වය දැක්විය හැක. මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 04)

(III) "චිත්තවේගීය ශ්‍රමය සේවා අංශයේ සේවකයින්ගෙන් අත්‍යවශ්‍යයෙන්ම අපේක්ෂා කරන හැසිරීමකි". මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

05.

(I) විවිධත්ව කළමනාකරණය යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

(II) විවිධත්ව කළමනාකරණය කිරීමේ අභියෝග කවරේද?

(ලකුණු 04)

(III) විවිධත්ව කළමනාකරණය නොසලකා හැරීමේ ප්‍රතිවිපාක කවරේද? උදාහරණ යොදාගනිමින් පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

06.

(I) රැකියා - ජීවිත සමබරතාවය කෙරෙහි බලපාන සාධක කවරේද? කෙටියෙන් පහදන්න

(ලකුණු 03)

(II) රැකියා - ජීවිත සමබරතාවය ඇතිකිරීමට සහයෝගය ලබා දෙන, ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන නීතිමය විධිවිධාන වල අන්තර්ගතයන් සටහන් කරන්න.

(ලකුණු 04)

(III) "පුද්ගල රැකියා - ජීවිත සමබරතාවය ඇති කිරීම කෙරෙහි ආයතනය සතුවද වගකීමක් ඇත". මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

*****